# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1758/23 - 2012 මැයි 16 වැනි බදාදා - 2012.05.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තිය

2011.11.16 දින අංක අමප 11/2008/552/019 හා 2012.01.17 දින අංක අමප 12/0090/552/002 දරන අමාත්‍ය මණ්ඩල සංදේශ අනුව 2012.02.12 දින අමාත්‍ය මණ්ඩල තීරණ අංක 15 පරිදි 2012.05.08 දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තිය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ අංක 41 වගන්තියේ උප වගන්ති (01), (02) සහ (03) අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත්කරමි.

මහින්දානන්ද අළුත්ගමගේ (පා.ම.),
ක්‍රීඩා අමාත්‍ය.

2012 මැයි මස 15 වැනි දින,
කොළඹ ක්‍රීඩා අමාත්‍යාංශයේ දී ය.

ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තිය

***පූර්විකාව***

ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ඉතිහාසය විමසීමේදී, 1948 වර්ෂය ශ්‍රී ලංකාවට ස්වර්ණමය වසරක් වන්නේ නිදහස් ශ්‍රී ලංකාවේ ක්‍රීඩකයෙක් ප්‍රථම වතාවට ජාත්‍යන්තර ඔලිම්පික් ක්‍රීඩා තරගාවලියේදී රිදී පදක්කමක් හිමිකර දෙමින් ප්‍රථම ජාත්‍යන්තර කීර්තිය ගෙන දීමයි.

ඩන්කන් වයිට් මහතා මීටර් 400 කඩුලු පැනීම තරගයෙන් එම ජයග්‍රහණය හිමිකර ගැනීමෙන් ඇරඹී ශ්‍රී ලංකාවේ ක්‍රීඩා වංශ කථාව ගත වූ හැටතුන් වසර පුරා විවිධ උච්ඡාවචනයන්ගෙන් යුතුව ඉදිරියට ගමන් කර ඇත. එහිදී 2000 වසරේ දී සුසන්තිකා ජයසිංහ ක්‍රීඩිකාව යළිත් ජාත්‍යන්තර ඔලිම්පික් ක්‍රීඩා තරගයකදී ශ්‍රී ලංකාවට රිදී පදක්කමක් හිමිකර දෙමින් ලබාගත් ජයග්‍රහණය මෑතකදී ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ක්‍රීඩා ක්ෂේත්‍රයේ ලබාගත් ඉහළම සම්මානය වේ. ඒ අතරතුර පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල ලෝක ක්‍රීඩා ශූරතාවලිය, ආසියානු ක්‍රීඩා උළෙල හා දකුණු ආසියානු තරඟවලින් හිදී ශ්‍රී ලංකාව විවිධ ක්‍රීඩා ජයග්‍රහණ රැසක් හිමිකර ගනිමින් ශ්‍රී ලංකාවට අභිමානයක් ගෙන දී ඇත.

තවද ක්‍රිකට් ක්‍රීඩාවෙන් ශ්‍රී ලංකාව ලෝක ශූරයන් වීම හා අනු ශූරතාවය දෙවරක් දිනාගනිමින් එම ක්‍රීඩාවෙන් ලෝක පූජිත වීමට හැකි වී තිබීම ශ්‍රී ලංකාවට මහත් අභිමානයක් වී ඇත.

1A - G 016040 — 340 (2012/05)

එහෙත් ගත වූ දසවසර තුළ ශ්‍රී ලංකාව ක්‍රීඩා කේෂ්ත්‍රයේ යම් පසුබෑමක් සිදුවී ඇති බව විද්‍යාමාන වුවද ඒ සඳහා හේතු පාදක වූ සාධක රැසක් හඳුනාගත හැකිය. විශේෂයෙන්ම දශක 3 කට අධික කාලයක් ශ්‍රී ලංකාවේ පැවති යුද ගැටුම් හා තරුණ කැරලි හේතු කොටගෙන ශ්‍රී ලංකාවේ තරුණ පරපුර ක්‍රීඩා දක්ෂතාවයන්ගෙන් නිසි ඵල නෙලා ගැනීමට නොහැකි වී තිබුණි. උදාවී ඇති සාමකාමී පරිසරය තුළ, ජාතියේ සමගිය, සාමය හා සංවර්ධනය උදෙසා ක්‍රීඩාව බෙහෙවින් ඵලදායී ලෙස යොදාගත හැකි අතර තරුණ පරපුරේ නිරෝගී බව හා ක්‍රීඩා කෞශල්‍යයන් උද්දීපනය කෙට ඵලදායී විනය ගරුක කණ්ඩායම් හැඟීමෙන් යුතු ක්‍රියාශීලී ජනතාවක් බිහිකිරීම උදෙසා ක්‍රීඩාවට ඉටු කළ හැකි මෙහෙවර අතිමහත්ය. එමෙන්ම ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවට අදාල යටිතල පහසුකම් වර්ධනය කරමින් ක්‍රීඩාව සඳහා ශ්‍රී ලංකාව ආකර්ෂණීය ස්ථානයක් ලෙස ප්‍රචලිත කරමින් ආර්ථික සංවර්ධනය උදෙසා ක්‍රීඩාව උපයෝගී කර ගැනීමත් ලාංකික සමාජය තුළ ක්‍රීඩා සංස්කෘතියක් බිහිකරමින් ආසියාවේ ක්‍රීඩා කේෂ්ත්‍රයේ ආශ්චර්යමත් රටක් බවට ශ්‍රී ලංකාව පත් කිරීමත් යුග අවශ්‍යතාවයක් ලෙස මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශය හඳුනාගෙන ඇත.

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය උදෙසා සක්‍රීය දායකත්වයක් සැලසීමට ක්‍රීඩා කේෂ්ත්‍රයේ ඇති විභවතාවය වර්ධනය කිරීමට අපේක්ෂිතය. සංචාරක කර්මාන්තය ප්‍රවර්දනය උදෙසා ක්‍රීඩාව දායක කර ගත හැකි අතර විශේෂයෙන් ක්‍රිකට් ක්‍රීඩාව තුළින් ශ්‍රී ලංකාව ලබා ඇති අන්තර්ජාතික කීර්තිය ඒ උදෙසා බෙහෙවින් ඉවහල්වේ. එමෙන්ම ගෝල්ෆ් ක්‍රීඩාව, රළ මත පාවීම (Surfing) හා අනෙකුත් ජල ක්‍රීඩා සඳහා ශ්‍රී ලංකාවේ ඇති අවකාශයන් හා අවස්ථාවන් බහුලය. විශේෂයෙන් මෝටර් රථ ධාවනය, කඳු නැගීම, වෙරළ ආශ්‍රිත ක්‍රීඩා, තුරඟ තරඟ වැනි ක්‍රීඩා ඉතා පහසුවෙන් ප්‍රවර්ධනය කර ගනිමින් සංචාරක ආකර්ශණය දිනා ගත හැකි ක්‍රීඩා ලෙස ප්‍රචලිත කළ හැකිය.

විශේෂයෙන් ශ්‍රී ලංකාවේ ඇති ස්වාභාවික අමුද්‍රව්‍ය හා කුසලතා පිරිපුන් ශ්‍රමය පදනම් කර ගනිමින් ක්‍රීඩා කේෂ්ත්‍රයේ ඉල්ලුමක් ඇති ක්‍රීඩා භාණ්ඩ හා මෙවලම් නිෂ්පාදනය සඳහා ආයෝජකයින් දිරිගැන්වීම තුළින් ක්‍රීඩා ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනයට දායක විය හැකිය.

එමෙන්ම ශ්‍රී ලාංකික ක්‍රීඩකයින්ගේ හා ක්‍රීඩා ආශ්‍රිත මානව සම්පත් සංවර්ධනය තුළින් ඔවුන්ගේ ඵලදායීතාවය උපයෝගී කරගනිමින් ජාත්‍යන්තර පුහුණුකරුවන් හා ක්‍රීඩා උපදේශකයන් ලෙස ක්‍රියා කළ හැකි මානව සම්පත් වර්ධනය කළ හැකිය. මෙම ක්‍රියාකාරකම් ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා බෙහෙවින් ඉවහල් කර ගත හැකිය.

ශ්‍රී ලංකාවේ ඇති දේශගුණික වාසිදායක තත්ත්වය උපයෝගී කර ගනිමින් විදේශීය ක්‍රීඩකයින් සඳහා වසර පුරාම පුහුණුව ලබා දිය හැකි ජාත්‍යන්තර පුහුණු මධ්‍යස්ථානයක් ලෙස වර්ධනය කළ හැකිය.

එහිදී ක්‍රීඩාව වැදගත් ආර්ථික ක්‍රියාදාමයක් ලෙස සලකා විශ්ලේෂණය කිරීම හා ඒ ආශ්‍රිත සානුබලයන් සැලසීම වැදගත් බව මෙහිදී අවධාරණය කෙරේ.

එම යුග මෙහෙවර ඉටු කර ගැනීම සඳහා ක්‍රීඩාවේ උන්නතියට හේතුවන සියළු සාධක සැලකිල්ලට ගෙන ක්‍රමවත් විද්‍යාත්මක පදනමකින් යුතුව ශ්‍රී ලංකාවේ ක්‍රීඩා කේෂ්ත්‍රය සංවර්ධනය කිරීමේ අපේක්ෂාවෙන් ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කිරීමට අපේක්ෂා කෙරේ. එමගින් ක්‍රීඩාවට සම්බන්ධ සියළු පාර්ශවයන් මෙම ක්‍රීඩා ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කිරීම අපේක්ෂා කෙරේ.

***දැක්ම***

**ශ්‍රී ලංකාව, ආසියාවේ ක්‍රීඩාවෙන් බලවත්ම රට බවට පත්වීම**

***මෙහෙවර***

සෞඛ්‍ය සම්පන්න, විනය ගරුක, එක්සත් හා සෞභාග්‍යමත් සමාජයක් උදෙසා ක්‍රීඩාව තුළින් අභිමානවත් ජාතියක් බවට පත්වීම.

***අභිමතාර්ථ***

1. ශ්‍රී ලාංකීය සංස්කෘතියේ හා සමාජයේ ක්‍රීඩාව අත්‍යාවශ්‍ය අංගයක් බවට පත් කිරීම.

2. සියළු ශ්‍රී ලාංකිකයින්ගේ ජීවන තත්වය උසස් කර ගැනීම, ශාරීරික සුවය හා සෞඛ්‍ය දියුණුකර ගැනීම සඳහා ක්‍රීඩාව උපයෝගී කර ගැනීම.

3. සෑම කෙනෙකුටම ක්‍රීඩාවට සහභාගිවිය හැකිවන පරිදි ඒ සඳහා අවශ්‍ය දැනුම ඉඩකඩ හා අවස්ථා සලසා දීම.

4. ක්‍රීඩාව සමස්තයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය සම්පත් හා සුදුසු යටිතල පහසුකම් ලබාදීම.

5. සෑම ශ්‍රී ලාංකිකයකුටම ක්‍රීඩා අංශයෙන් හැකි ඉහලම තලයට ළඟාවීමට අවශ්‍ය සහාය ලබාදී ශ්‍රී ලංකාව ක්‍රීඩා කෞශල්‍යයෙන් සාර්ථක ජාතිකයක් ලෙස ජාත්‍යන්තර වශයෙන් ලබා ඇති ප්‍රතිරූපය පැහැදිලිව දැකගත හැකි හා ධරණීය එකක් බවට ප්‍රකට කිරීම.

6. ශ්‍රී ලංකාවේ ක්‍රීඩා කර්මාන්තය දියුණු කර නව රැකියා මාර්ග බිහිකර ආර්ථිකය ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම.

7. ශ්‍රී ලංකාවේ ප්‍රධාන විදේශ විනිමය ඉපැයුම් ක්ෂේත්‍රයක් ලෙස ක්‍රීඩා ක්ෂේත්‍රය යොදා ගැනීම.

8. සාමය හා වාර්ගික ඒකාග්‍රතාවය සඳහා ක්‍රීඩාව උපයෝගී කර ගැනීම.

***ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියේ මූලිකාංග***

**01. සෑම පුරවැසියකුම ක්‍රීඩකයෙක්**

ක්‍රීඩාවේ සාරධර්ම හා එහි ප්‍රතිලාභ පිළිබඳ දැනුමක් සෑම ශ්‍රී ලාංකිකයකුටම ලබා දී ක්‍රීඩා පහසුකම් හා වැඩසටහන් සඳහා සියළු දෙනා සහභාගි කරවා ගෙන රටපුරාම ක්‍රීඩාව හා විනෝද කටයුතු සඳහා වැඩි වැඩියෙන් ජනයා සහභාගි කරවා ගැනීම.

විශේෂයෙන් තරුණ තරුණියන් අතරත් පොදු මහජනතාව තුළත් ක්‍රීඩාව පිළිබඳ උනන්දුවක් ඇතිකර මුළු ජීවිත කාලය පුරාම ඔවුන්ගේ ශාරීරික හා මානසික සෞඛ්‍ය වැඩිදියුණු කරගනිමින් විනය ගරුකව කණ්ඩායම් හැඟීමෙන් හා නායකත්වය දෙමින් තම සහෝදර ජනතාව සමග එකමුතු වී මානව සාරධර්ම ප්‍රයත්නයන් ඉහළම තත්වයකින් පවත්වා ගැනීම.

**02. නව ක්‍රීඩා සංස්කෘතියක්**

*ශ්‍රී ලංකාව තුළ "ක්‍රීඩා සංස්කෘතියක්" ස්ථාපිත කිරීම සඳහා අනුබල දීම.*

නව ක්‍රීඩා සංස්කෘතියක් බිහිවන්නේ මහජනතාවගේ සිතුම් පැතුම් හා ක්‍රියාකාරකම් අනුවය. ක්‍රීඩා සංස්කෘතියක් බිහි කළ යුත්තේ මහජනයාට ක්‍රීඩාව සිය ජීවිතයේ අත්‍යවශ්‍ය කොටසක් ලෙස වැළඳ ගැනීමට අනුබල දීම මගිනි.

**03. ශාරීරික සුවතාවයට ප්‍රමුඛතාවය**

*සමාජයේ සියළුම අංග ආවරණය වනසේ යහපත් ශාරීරික සුවතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අනුබල දීම.*

නිරෝගී ජනතාවක් බිහිකිරීමේදී පුරවැසියන්ගේ සෞඛ්‍ය හා ශාරීරික සනීපය වැඩිදියුණු කිරීම කෙරෙහි ඉහළම ප්‍රමුඛත්වයදීම ඉතා වැදගත් වේ. එහිදී පුළුල් වශයෙන් ක්‍රීඩාවන්හි සහ ශරීර සුවතා වැඩසටහන්හි නිත්‍ය ලෙස සහභාගි වී නිරෝගීමත් ජීවන රටාවක් ගෙනයාම සඳහා ඉවහල්වන දේශීය පෝෂ්‍යදායී සමතුලිත ආහාර වේලක් පරිභෝජනය සඳහා දිරිගැන්වීම තුළින් ඵලදායීතාව වර්ධනය කර ගැනීම.

**04. විනෝදාස්වාදය උදෙසා ක්‍රීඩාව**

*විනෝදාත්මක කටයුතු කෙරෙහි පුද්ගලයන් හා කණ්ඩායම් ආකර්ෂණය කර ගැනීම විශාල වශයෙන් ක්‍රීඩාව කෙරෙහි ආකර්ෂණය කර ගැනීමක් වන අතර එමගින් ඔවුන්ගේ නිපුනතා මට්ටම දැඩි ශාරීරික ක්‍රියාකාරීත්වයක් තුළින් වැඩි දියුණු කර තරඟකාරී ක්‍රීඩාවල නිරත වීම.*

ක්‍රීඩාව මගින් ආයතනගත ව්‍යුහයන් අනුගමනය කෙරෙන හෙයින් හා ඒවා නීති රීති හා රෙගුලාසි වලට අනුව කෙරෙන හෙයින් හුදු විනෝදාත්මක කටයුතු කෙරෙහි පුද්ගලයන් හා කණ්ඩායම් ආකර්ෂණය කර ශාරීරික ක්‍රියාකාරකම් කෙරෙහි නැඹුරු කරගත යුතුය. මේ මගින් සංවිධිත ක්‍රීඩා කටයුතු සඳහා පහළ මට්ටමේ ඇතුළත් වීමේ දොරටුවක් විවර වන අතර එමගින් වඩාත් උසස් මට්ටමේ නිපුණතා සාක්ෂාත් කර ගැනීමටත් මං පෙත් විවර වී තරඟකාරී ක්‍රීඩා සඳහා පුහුණු වීමට ඇතුළත් වන සංඛ්‍යාව වර්ධනය වේ.

**05. සාමය හා සංවර්ධනය උදෙසා ක්‍රීඩාව**

*ධරණීය සාමය හා සමාජ සංවර්ධනය සඳහා ක්‍රීඩාවට ප්‍රමුඛතාවය ලබාදීම.*

සියළු ජන කොටස් අතර සහයෝගීතාවය, අවබෝධය හා මිත්‍රත්වය වැඩි දියුණුව ඇති කරමින් ශක්තිමත් සෞඛ්‍ය සම්පන්න ප්‍රීතිමත් ජනතාවක් බවට පත් කිරීමට සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා මානව ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය සඳහා ක්‍රීඩාව ගාමක බලවේගයක් බවට පත් කළ යුතුය.

**06. ක්‍රීඩාශීලි තාරුණ්‍යයට දීප්තිමත් අනාගතයක්**

*තරුණ පරපුර රටෙහි අනාගත ජීවනාලිය වන බැවින් ඔවුන්ගේ ශාරීරික, මානසික නිරෝගීභාවය හා ශ්‍රම ඵලදායීතාව වර්ධනය සඳහා ක්‍රීඩාව වෙත තරුණ කණ්ඩායම් යොමු කිරීමට දිරිගැන්වීම.*

රටක අනාගතය තරුණ පරපුර මත රැඳී ඇති අතර නිරෝගිමත්, කාර්යශූර, ඵලදායී සහ කණ්ඩායම් හැඟීමෙන් යුතු ඔවුන්ගේ ඉදිරි ජීවිතය තුළ හොඳ ශරීර සෞඛ්‍යයෙන් යුතුව වගකීම් දරා සිටීමට අවශ්‍ය ජීවන කුසලතා සහ මෘදු හැකියාවන් ලබාදී ප්‍රායෝජනවත් ලෙස සේවය කිරීමට ක්‍රීඩාව මගින් අවශ්‍ය නිපුණතා සපුරමින් උපරිම සේවයක් කළ හැකිවන පරිදි ශ්‍රී ලංකාවේ අනාගත අභිවෘද්ධිය සඳහා සිය සහෝදර රට වැසියන් සමග සහජීවනයෙන් ජීවත්වීමට කටයුතු සැලැස්වීම.

**07. පාසල් අවධියේදී ක්‍රීඩා හා විශේෂ කුසලතා ඇති දරුවන් හඳුනා ගැනීම**

*සියළුම පාසල් දරුවන්ගේ හා තරුණයන්ගේ ක්‍රීඩා කෞශල්‍යයන් නිර්ණය කිරීම සඳහා වෛද්‍ය පරීක්ෂාවකට යොමු කිරීම.*

සියළු ළමයින් හා තරුණ තරුණියන් මුල් කාලයේදී (අ) ආධ්‍යාත්මික හා (ආ) විෂය මූලික කුසලතා හඳුනා ගැනීමේ ක්‍රම වේදයකට භාජනය කර ප්‍රධාන ක්‍රීඩා තරඟවලදී ඉහළ මට්ටමකට ළඟා වීමට ඇති හැකියාව හා ඔවුන්ගේ සත්‍ය කාර්ය සාධන හැකියාව මැන බැලීම.

**08. පාසලෙන් ක්‍රීඩාවට**

*පාසල් විෂය මාලාව තුළ ක්‍රීඩා අධ්‍යාපනය, පුහුණුව හා ශාරීරික සුවතාව සඳහා ප්‍රමුඛතාවය ලබාදීම.*

පාසල් ළමයින්හට සර්ව සම්පූර්න හා සමබර අධ්‍යාපනයක් ලබාදීමේදී පාසල්වල සම්පූර්ණ ශාරීරික අධ්‍යාපන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛත්වය ලබාදිය යුතු අතර, එමගින් අවශ්‍ය ශාරීරික ලක්ෂණ හා නිපුණතා වර්ධනය කර පන්ති කාමරය තුළ ශාස්ත්‍රීය කාර්ය සාධනය වැඩිකර විශාල වශයෙන් ක්‍රීඩාවට සහභාගිවීමේ පදනම ගොඩනැංවිය යුතුය.

**09. ගමටත් ක්‍රීඩා සමාජ**

*සියළුම ග්‍රාම නිලධාරී වසමක් තුළම ක්‍රීඩා සමාජයක් ස්තාපිත කිරීමට සානුබලයන් සැපයීම.*

ග්‍රාමීය මට්ටමින් සංවිධානාත්මක වැඩිදියුණු කිරීම් සඳහා සෑම ග්‍රාම නිලධාරී වසමක්ම ආවරනය වන ලෙස ක්‍රීඩා සමාජයක් ස්ථාපිත කර ග්‍රාමීය ක්‍රීඩා සමාජ ඒකාබද්ධව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රාදේශීය ක්‍රීඩා සමිති ස්ථාපිත කිරීම හා අනතුරුව දිස්ත්‍රික් / පළාත් හා ජාතික ක්‍රීඩා සංගම් ඒකාබද්ධ කර ක්‍රීඩා සංවිධාන ජාලයක් ගොඩනැගීමට දිරිගැන්වීම.

**10. ක්‍රීඩා සමාජයන්ට අතහිත**

*රටපුරා පිහිටුවනු ලබන ක්‍රීඩා සමාජ සංඛ්‍යාව වැඩි කිරීමෙන් පළාත්බද හා ජාතික ක්‍රීඩා සංගම් ශක්තිමත්කර ඒවාට අවශ්‍ය සානුබලයන් සැපයීම.*

සියළු පළාත්බද හා ජාතික ක්‍රීඩා සංගම් වල සාමාජික සංඛ්‍යාව වැඩි කළ හැකිවන පරිදි දැනට තිබෙන ක්‍රීඩා සමාජ ශක්තිමත් කිරීමෙන් හෝ අළුතින් සමාජ පිහිටුවීමට ආධාර දීමෙන්, අළුතින් බිහිවන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අවශ්‍ය මංපෙත් විවර කර දී ප්‍රජා මට්ටමේ ක්‍රීඩාවලට විශාල වශයෙන් සහභාගිවීම වර්ධනය කෙරෙන ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම.

**11. ක්‍රීඩාවට ලෝක ව්‍යාප්ත දැනුම**

*ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට විදේශීය පුහුණු, නව ක්‍රමවේදයන් පිළිබඳ දැනුම, ක්‍රීඩා තාක්ෂණය සහ අදාල සියළු ක්ෂේත්‍රවල විශේෂඥ දැනුම ලබාගැනීමේ අවස්ථා ලබාදී, ප්‍රධාන ජාත්‍යන්තර ක්‍රීඩා තරඟවලදී ඔවුන්ට විදේශීය ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමග සම සමව ක්‍රීඩා කිරීමේ හැකියාව ලබාදීම.*

ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා තරඟ වලට සහභාගී වී ජයග්‍රහණ ලබා ගැනීමට නම්, නවීනතම තාක්ෂණික දැනුම, පුහුණු ක්‍රමවේද සහ වෙනත් විශේෂඥ දැනුම ලබා ගැනීම වැදගත්ය. ක්‍රීඩක ක්‍රීඩිකාවන් ට අවශ්‍ය සියළු සම්පත් ලබා ගැනීමට අවශ්‍ය සහාය ලබා දිය යුතු අතර, ඒ සමගම දේශීය විශේෂඥයින්ගේ ධාරිතාව අනාගතයේ දී වැඩි කර ගැනීම හා සංවර්ධනය කිරීම මගින් එකී විශේෂඥතා වර්ධනය කර ගැනීමට අවශ්‍ය පර්යේෂණ කටයුතු සිදු කිරීම අවශ්‍යය.

**12. කාන්තාවන් ක්‍රීඩාවෙන් පෙරමුණට**

*කාන්තාවන් ක්‍රීඩා වල නියැළීම සඳහා අවස්ථා ලබා දීම හා සානුබලයන් සැපයීම.*

ක්‍රීඩාවල නියැලීමේ වැදගත්කම, වටිනාකම හා ප්‍රතිලාභ සියළුම කාන්තාවන්ට විස්තර කර දී, ඔවුන්ගේ ශාරීරික සෞඛ්‍යය, ප්‍රමෝදය ඉහළ නැංවීම හා හැකි නම් ප්‍රධාන ක්‍රීඩා ඉසව් වලට සහභාගිවී ඉහළම ජයග්‍රහණ ලබා ගැනීමේ හැකියාව ලැබෙන පරිදි ඔවුන්ට ඒ සඳහා අවතීර්ණ වීමට හා ක්‍රීඩා වලට සහභාගි වීමට අවස්ථාව ලබා දීමට පියවර ගත යුතුය. එසේම ලෝක ශූරතාව ආසියානු ක්‍රීඩා උළෙල, පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා හා ඔලිම්පික් ක්‍රීඩා වැනි ක්‍රීඩා තරඟ වලට සහභාගි වන ශ්‍රී ලංකා කණ්ඩායම් වල ක්‍රීඩිකාවන්ගේ සහභාගීත්වය ප්‍රතිශතය වැඩි කළ යුතුය.

**13. ක්‍රීඩා වලට පරිනත ක්‍රීඩකයන්ගේ සහභාගිත්වය**

*පරිනත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ක්‍රීඩාවලට සහභාගී වීමේ අවස්ථාව ලබා දීම.*

මිනිසුන් වයස්ගතවත් ම ඔවුන් නිතර නිතර අසනීප වීමේ නැඹුරුව වැඩි වන අතර ඔවුන්ට පවුලේ සහාය අවශ්‍ය වේ. විශ්‍රාමිකයන්ට හා මේරු වයස් වල සිටින අය සඳහා ක්‍රීඩා කටයුතු සංවිධානය කිරීමෙන් සාමාන්‍යයෙන් වැළඳෙන රෝග වැළඳීම ප්‍රමාද කිරීමෙන් ඔවුන්ට මෙන්ම රජයට ද වැය කිරීමට සිදුවන අතිරේක මුදල අඩු කර ගැනීමට හැකි වන අතර සාමාන්‍යයෙන් ක්‍රීඩා එතරම්ම බහුලව නොපවතින කාල වල මහජනයා ඒවාට නැඹුරු කරවීමටත් හැකි වේ. ඉහළ මට්ටමේ ක්‍රීඩා තරඟ බෙහෙවින් තිබෙන අතර එමගින් තරඟ පවත්වන රටවලට ආර්ථික ලාභ ලබා ගැනීමට ද හැකි වේ.

**14. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් ක්‍රීඩාවෙන් ඉදිරියට**

*සිය ශාරීරික හා මානසික සෞඛ්‍ය දියුණු කර ගැනීමටත් විනෝදාශ්වාදය හා පෞරුෂත්ව වර්ධනයටත් තුඩු දෙන ක්‍රීඩාවල නියැළීමට විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් දිරිමත් කිරීම.*

ස්වාභාවික හේතූන් නිසා හෝ සමාජ ව්‍යසනයන්ට ගොදුරු වීම නිසා ආබාධිත තත්ත්වයට පත්වන පුද්ගලයින් ද සමාජයේ වැදගත් කොටසක් ලෙස සැලකිය යුතු අතර, ඔවුන්ට විනෝදාශ්වාදය, ප්‍රීතිය හා පෞරුෂත්ව වර්ධනය ළඟා කර ගෙන ක්‍රීඩා තරඟ වල දී උසස් ජයග්‍රහණ අවශ්‍ය පහසුකම් ලබා දිය යුතුය. ඒ අනුව, ඔවුන් සමාජයේ අත්‍යවශ්‍ය කොසටක් බවට පත් වනු ඇත. ක්‍රීඩා සංගම් විසින් ආබාධිත පුද්ගලයින් සිය ප්‍රධාන ක්‍රීඩා කටයුතු වලට සහභාගී කරවා ගැනීමට අවශ්‍ය යාන්ත්‍රණය සකස් කර ගත යුතුය.

**15. ආයතනික සංවර්ධනය තුළින් ශක්තිමත් ක්‍රීඩා සංවිධාන ජාලයක්**

*ක්‍රීඩා සංවිධානයන් හී නෛතික රාමුව හා කළමනාකරණ ව්‍යුහයත් සංවර්ධනය කිරීම හා ක්‍රීඩා වැඩ සටහන් ආරම්භ කොට නවීකරණය කිරීම.*

ක්‍රීඩා ආයතන හා නියෝජිතායතන වලට සම්බන්ධ නෛතික කටයුතු, පරිපාලනයමය, කළමනාකාර හා මෙහෙයුම් කාර්යයන් ශක්තිමත් කිරීම මගින් ඒවා ගතික, ප්‍රතිචාරී සහ ක්‍රීඩා සංවර්ධනය අතින් කාර්යක්ෂම ආයතන බවට පත් කොට, නවීන සමාජ ප්‍රවණතාවලින් ඉදිරියට ගොස් ඒවායේ ඉලක්ක කාර්යක්ෂම ලෙස සපුරා ගැනීමට සමත් විය යුතුය. වගකිව යුතු භාවය සාක්ෂාත්කර ගැනීම සඳහා සියළු කටයුතු වල දී යහ පාලනය හා පාරදෘශ්‍ය භාවය සහතික කරනු පිණිස ක්‍රියා මාර්ග ගත යුතු අතර, ක්‍රීඩාවට සම්බන්ධ සියළු ආයතන වල තීරණ ගැනීම හා වළදායීතාව නීතිය හා සාමයට ගරු කරමින් සිදු කළ යුතුය. ක්‍රීඩාව පරිපාලනය කිරීමට සම්බන්ධ විවිධ නියෝජිතායතන වල ඒකීය ස්වභාවය හා සහයෝගීතාව සහතික කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම ද අවශ්‍යය.

**16. ක්‍රීඩා සංවිධාන වල ස්වාධීනත්වය**

*ක්‍රීඩා සංගම්වල නිලධාරීන් තෝරා ගැනීමේ දී ක්‍රීඩා සංවිධාන වල ස්වාධීනත්වය ආරක්ෂා කරනු සඳහා අවශ්‍ය පරිසරය සැකසීම.*

ක්‍රීඩා සංවිධානවල නිළධාරීන් තෝරා ගැනීමේදී ඒවායේ ස්වාධීනත්වය ආරක්ෂාවන පරිදි සුදුසු පුද්ගලයන් පත්කරගැනීමට ඉවහල්වන නෛතික පිළියම් යෙදීම අවශ්‍යය.

**17. ක්‍රීඩා සංවර්ධනය සඳහා සාමූහික ප්‍රවේශයක්**

*ක්‍රීඩාව භාර රජයේ සහ පළාත් සභා වල අමාත්‍යාංශ විසින් ඒකාබද්ධ ක්‍රියා මාර්ගයක් ගැනීමෙන් ක්‍රීඩාව දියුණු කිරීමට කටයුතු කිරීම.*

රජයේ සහ පළාත් සභාවල ක්‍රීඩා කටයුතු භාර සියළු ආයතන විසින් ඒකාබද්ධ අවතීර්ණයකින් කටයුතු කර සියළු ජාතික ක්‍රීඩා සංගම්, පළාත් බද, දිස්ත්‍රික් හා කලාපීය ක්‍රීඩා සංවිධාන එම වැඩ සටහන ට ඇතුළත් කර, ක්‍රීඩා සංවර්ධන වැඩ සටහන් සැලසුම් කළ යුතුයි. ක්‍රීඩාව සමස්තයක් වශයෙන් දියුණු කිරීම සඳහා ජාතික උපායමාර්ගික සැලැස්මක් ආරම්භ කර, හඳුනාගත් සියළු පාර්ශ්වකරුවන් විසින් එය අනුගමනය කළ යුතුයි.

**18. ගමට ක්‍රීඩා පහසුකම්**

*ක්‍රීඩාව ගමට ගෙන යාම අරමුණු කරගෙන රට පුරා ක්‍රීඩා සංවර්ධනයට අදාළ භෞතික පහසුකම් සඳහා සානුබලයන් සැපයීම.*

ගම්බද තරුණ තරුණියන්ගේ ක්‍රීඩා කෞශල්‍යයන් ඉහළ නැංවීම සඳහා ජාතික ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ සැලැස්මක් අනුව ග්‍රාමීය මට්ටමින් ක්‍රීඩා සංවර්ධනය කිරීමේ වැඩ සටහනක් ආරම්භ කර ඔවුන්ට ජාත්‍යන්තර ක්‍රීඩා තරඟ වලින් ජය ගත හැකි වන පරිදි අවශ්‍ය පුහුණුව හා දත්ත පදනමක් ආරම්භ කර ඒවා පවතින ස්ථාන හඳුනාගෙන පාවිච්චි කෙරෙන සංඛ්‍යාව, එක් එක් ස්ථානයේ සේවා සැපයෙන ක්‍රීඩා විශේෂය සහ ඒවායේ ව්‍යුහය, විශේෂ ලක්ෂණ සහ ප්‍රමිතිය පවත්වාගෙන යා යුතුය. ප්‍රතිසම්පාදන කටයුතු උපලේඛන ගත කර සමස්ත නඩත්තු ක්‍රියාවලිය හා ජීවන චක්‍ර පිරිවැය ද තබා ගත යුතුය.

**19. සාම්ප්‍රදායික ක්‍රීඩා වලට අභිමානය**

*සාම්ප්‍රදායික ක්‍රීඩා ප්‍රචලිත කිරීම හා සංවර්ධනය කිරීමට දිරි ගැන්වීම.*

අතීතයේ පටන් පැවත එන අපගේ ජාතියට ආවේණික ක්‍රීඩා වඩාත් ව්‍යාප්ත කිරීම සඳහා පාරම්පරික ක්‍රීඩා දැනුම අද්‍යතන සමාජය තුළ ප්‍රචලිත කොට, මතු පරපුර සඳහා දායාද කර තැබිය යුතුය. එම ක්‍රීඩා පිළිබඳ තොරතුරු ලේඛන ගත කර සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කළ යුතුය.

**20. ඵලදායීතාව උදෙසා මානව සම්පත් සංවර්ධනය**

*විවිධ ක්‍රීඩා අංශ වලට අදාලව මානව නිපුණතා වර්ධනය කර, ධාරිතාව පුළුල් කර මානව සම්පත් වර්ධනය කිරීමෙන් ක්‍රීඩා සංවර්ධනය සඳහා කටයුතු කරන රාජ්‍ය ආයතන විසින් ක්‍රියාත්මක කළ හැකි ඵලදායී ක්‍රියා පිළිවෙතක් සඳහා සානුබලයන් ලබා දිය යුතුය.*

ක්‍රීඩා ප්‍රවර්ධනය කිරීමේ කටයුතු වල නියැළී සිටින රජයේ ආයතන වල ඵලදායීතාව වැඩි දියුණු කිරීම අරමුණු කරගත් කළමනාකරණ සංවර්ධන කාර්යයන් කිරීමත්, එවන් ආයතන වල මානව සම්පත් සංවර්ධනය කිරීම කෙරෙහි යොමු වූ පිළිවෙතකට අනුබලයන් ලබා දීම අවශ්‍යය. ක්‍රීඩාව පිළිබඳ තාක්ෂණික හා කළමණාකරන පුහුණුව ලබා ගැනීමට ජනතාවට අනුබල දෙන ක්‍රමවේදයක් හා බලපත් ලබා දීමේ ක්‍රමයක් ආරම්භ කර ඔවුන්ගේ ප්‍රවීණතාව ඉහළ නැංවීමේ මං පෙත් විවර කොට සුදුසුකම් අතින් ඉහළ මට්ටම් වලට ළඟා වී සහතික කිරීම හරහා ඒවා පිලිගැනීමට හැකි තත්වයකට යා යුතුය. පුහුණුකරුවන් ලෙස යොදවා සිටින සංඛ්‍යාව, විවිධ නිපුණතා මට්ටම් වල සිටින නිලධාරින් සහ පරිපාලකයන් සංඛ්‍යාව සහ ඔවුන් සේවයේ යොදවා සිටින ස්ථාන පිළිබඳ දත්ත පදනමක් ආරම්භ කොට ඔවුන්ගේ කටයුතු වලට අදාල අලුත්ම තත්ත්වයන් පිළිබඳ තොරතුරු අඛණ්ඩව යාවත්කාලීන කළ යුතුය.

**21. ක්‍රීඩාවට ස්වේච්ඡා සේවකයන්ගේ සහාය**

*ස්වේච්ඡාවෙන් ක්‍රීඩාවල නියැළි පුද්ගලයන් ධෛර්යමත් කිරීම සහ සංවර්ධනය කිරීම.*

ස්වේච්ඡාවෙන් ක්‍රීඩාවල නියැළි ස්වේච්ඡා සේවකයන්,

(අ) බඳවා ගැනීමේ

(ආ) රඳවා ගැනීමේ හා

(ඇ) ඇගයීමේ ක්‍රම වේදයක් ආරම්භ කළ යුතුය. මේ මගින් දෛනික පදනමක් මත වැඩ කරන පුද්ගලයන් සංඛ්‍යාව වැඩි කර ගැනීමටත්, සිය වැඩ සටහන් රට පුරා ව්‍යාප්ත කිරීමටත් සියළු ක්‍රීඩා නියෝජිතායතන වලට අරපිරිමැසුම්දායි ලෙස සහය ලබා දීමටත් හැකි වේ.

**22. සැමට ක්‍රීඩා වෛද්‍ය පහසුකම්**

*ක්‍රීඩා වෛද්‍ය පහසුකම් රට පුරා ව්‍යාප්ත කිරීමට අනුග්‍රහකත්වය දැක්වීම.*

ක්‍රීඩා ක්ෂේත්‍රයේ නියැළී සැමට අවශ්‍ය ක්‍රීඩා වෛද්‍ය පහසුකම් ව්‍යාප්ත කිරීම සඳහා පළාත් හා දිස්ත්‍රික් මට්ටමින් එම පහසුකම් සැපයීමට කටයුතු කළ යුතුය. එසේම ක්‍රීඩකයන්ට හා ක්‍රීඩා පුහුණුකරුවන්ට වෛද්‍ය කටයුතු පිළිබඳ දැනුමක් සහිත අධ්‍යාපනයක් ලබාදිය යුතුය. එහි පරමාර්ථය වනුයේ හැකි සැම අවස්ථාවකදීම ආබාධ අවස්ථා වළක්වා ගැනීම, පුනරුත්ථාපනය, වඩාත් හොඳින් කළමණාකරනය කිරීම හා තරගවලදී ඉහළම දක්ෂතා ලබාගැනීමට හැකි ක්‍රීඩා වෛද්‍ය මගපෙන්වීම ලබාදීමයි.

**23. ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ සම්මුතිවලට අනුකූලතාවය**

*ක්‍රීඩා සංවර්ධනයේ නියැලි සියළුම ක්‍රීඩා සංගම් හා ආයතනවලට ජාත්‍යන්තර ඔලිම්පික් ප්‍රඥප්තියට අනුකූලව තෝරා ගැනීමේ නිර්නායකයන් හා ක්‍රියාවලින් දැඩි ලෙස අනුගමනය කිරීමට ක්‍රීඩාවේ නියැලි පුද්ගලයින් පුහුණු කිරීමට හා කළමණාකරනය කිරීමට මෙන්ම ජාත්‍යන්තර රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමටද අනුබල දෙනු ලැබේ.*

තෝරාගැනීම, පුහුණුව, කළමණාකරනය විනය කටයුතු හා ක්‍රීඩා ඉසව් සංවිධානය යන කටයුතු වලට අදාල සියළු ක්‍රියාවලින් ජාත්‍යන්තර ක්‍රීඩා ප්‍රමිතීන්ට අනුකූලව සිදුකල යුතු අතර ඒවාට අදාල සියළු කටයුතු ජාත්‍යන්තර ඔලිම්පික් ප්‍රඥප්තියට ගරුකරමින් සිදුකළ යුතුය.

**24. තහනම් උත්තේජක භාවිතයට තිත**

*ලෝක මත්ද්‍රව්‍ය විරෝධී නියෝජිතායතනයේ නීතිරීතිවලට අනුකූලව තහනම් උත්තේජක හා මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ නීතිරීති ක්‍රියාත්මක කිරීම.*

ක්‍රීඩාවේදී තහනම් උත්තේජක හා මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයට එරෙහි ජාත්‍යන්තර ප්‍රඥප්තියට සහ ලෝක මත්ද්‍රව්‍ය විරෝධී නියෝජිතායතනයේ නීති සංග්‍රහයට අනුකූලව ශ්‍රී ලංකාවේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් කටයුතු කරන බවට වගබලා ගනු ලැබේ. ප්‍රථම අවස්ථාවේදී ක්‍රීඩා මත්ද්‍රව්‍ය අධ්‍යාපන උපාය මාර්ගික වැඩ සටහනක් ක්‍රියාත්මක කරන අතර, ක්‍රීඩාවේදී නොගත යුතු යැයි තහනම් කර ඇති මත්ද්‍රව්‍ය නිෂ්පාදනය බෙදාහැරීම් හා /හෝ භාවිතයට සම්බන්ධ පුද්ගලයන්ට එරෙහිව නීතිමය ක්‍රියා මාර්ගයක් ගැනීමට අදාල කටයුතු විමර්ශනය කොට පරීක්ෂා කර නඩු පැවරීම සඳහා වූ බලය ලබාදුන් ආයතනයක් ශ්‍රී ලංකාවේ පිහිටුවීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

**25. ජාත්‍යන්තර තරඟ සඳහා රජයේ අනුග්‍රහය**

*සාක් ක්‍රීඩා, ආසියානු ක්‍රීඩා, පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා සහ ඔලිම්පික් ක්‍රීඩාවලට පූර්ණ රාජ්‍ය අනුග්‍රහය ලබාදීම.*

ප්‍රධාන ජාත්‍යන්තර ක්‍රීඩා තරඟවලට සහභාගි වන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට සහ ඒවාට සහභාගී වීම අවශ්‍ය වන රජයේ සහ වෙනත් ක්‍රීඩා සංගම් නිළධාරීන්ට නිශ්චිත ක්‍රමයක් යටතේ පූර්ණ රාජ්‍ය අනුග්‍රහය ලබාදෙනු ලැබේ. එසේ දෙනු ලබන ආධාර කොන්ත්‍රාත් ක්‍රමයක් යටතේ දිය යුතු අතර එහිදී ආධාරලාභීන් විසින් කල් තියා ගිවිසගත් කොන්දේසි වලට යටත්ව ඔවුන් ආපසු පැමිණීමෙන් පසුව ගිවිසගත් සේවාවක් මෙරටට ලබාදීමට පොරොන්දු විය යුතුය.

**26. ක්‍රීඩාවට දක්ෂයින්ට උසස් අධ්‍යාපනයට වරප්‍රසාද**

*ජාතික ක්‍රීඩා තරඟ ජයග්‍රහණ ලබන පාසල් දරුවන් විශ්ව විද්‍යාල ප්‍රවේශය හා අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන වලට ඇතුළත්වීමේදී විශේෂත්වයක් ලබා දීම.*

විශ්ව විද්‍යාල ප්‍රවේශය හා අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන වලට ඇතුලත්කර ගැනීමේදී, ජාතික, ජාත්‍යන්තර මට්ටමේ ජයග්‍රහණ ලද ක්‍රීඩකයින්ට වරප්‍රසාද හිමිකර දීම.

**27. ක්‍රීඩකයන් සඳහා වෘත්තීය අධ්‍යාපනය**

*ජාතික ක්‍රීඩා තරගාවලදී කළින් නියම කරන ලද කාර්ය සාධනය සාක්ෂාත් කරගන්නා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට විශේෂ අනුග්‍රහයන් හා සහන පදනම මත වෘත්තීමය පුහුණුව සඳහා යොමුකොට ඔවුන් ඵලදායී සේවයන් හි නිරත කරවීම.*

සිය ජීවිතයේ මුල් කාලයෙන් වැඩි කොටසක් දීර්ඝ ලෙස පුහුණු කටයුතු කිරීමට මෙන්ම ක්‍රීඩාවේ නියැලීම සඳහා ගත කරන ලද ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට සිය සාමාන්‍ය පාසැල් අධ්‍යාපනය සම්පූර්ණ කිරීමට හා අනාගතයේදී රැකියාවක් කිරීමට අවශ්‍ය ක්‍රීඩාවට අනුබද්ධ වෘත්තීයමය පාඨමාලා සහ උසස් අධ්‍යාපන ආයතනවල පාඨමාලා හැදෑරීමට අවශ්‍ය පහසුකම් හා සහන සලසා දෙනු ලැබේ.

**28. ක්‍රීඩාවේ උසස් අධ්‍යාපන හා පර්යේෂණ අවස්ථා**

*ක්‍රීඩා උපාධි, පශ්චාත් උපාධි ප්‍රදානය කරනු ලබන ජාතික ආයතන මෙන්ම අදාල පර්යේෂණ සිදුකරන හා එවැනි දේශීය හා ජාත්‍යන්තර ආයතන සමග සහයෝගයෙන් කටයුතු කරන ජාතික ආයතනවල සංවර්ධන කටයුතු සඳහා අනුග්‍රහය සලසනු ලැබේ.*

ක්‍රීඩා උපාධි, පශ්චාත් උපාධි ප්‍රදානය කරන හා ක්‍රීඩා කටයුතු පිළිබඳ පර්යේෂණ කාර්යයන්හි නියැලි ජාත්‍යන්තර විශ්ව විද්‍යාල සහ පර්යේෂණ ආයතන සමග සහයෝගයෙන් කටයුතු කරමින්, ජාතික ක්‍රීඩා විද්‍යායතනය හා ජාතික ක්‍රීඩා වෛද්‍ය ආයතනය ප්‍රතිව්‍යුහගත කොට ක්‍රීඩා විද්‍යාව හා ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව හා ඊට අනුගත ක්ෂේත්‍ර ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලවල ආරම්භ කොට එකී උපාධි සහ පශ්චාත් උපාධි ප්‍රදානය කිරීමට කටයුතු සලසනු ලැබේ.

**29. ලොව ජයගත් ක්‍රීඩකයන්ට විශේෂ වරප්‍රසාද**

*ජාත්‍යන්තර ක්‍රීඩා තරඟ ජයග්‍රාහකයන්ට ක්‍රීඩා ක්ෂේත්‍රයේ රාජ්‍ය රැකියා ලබාදීමේදී විශේෂත්වයක් ලබාදීම හා පෞද්ගලික අංශයේ රැකියා ලබාදීමේදී විශේෂත්වයක් ලබාදීමට දිරි ගැන්වීම.*

රාජ්‍ය හා පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා ලබාදීමේදී බඳවා ගැනීමේ පටිපාටියට දේශීය හා ජාත්‍යන්තර ක්‍රීඩා ජයග්‍රහණ ලබාගත් ක්‍රීඩකයන්ට ක්‍රීඩා කුසලතා හා බාහිර ක්‍රියාකාරකම් සඳහා අනිවාර්ය ලකුණු ප්‍රමාණයක් ලබාදීම සහ ඔවුන්ට රැකියා ස්ථානවලදී ක්‍රීඩාවල නියැලීමට අවශ්‍ය පහසුකම් සලසා දීමට කටයුතු කෙරේ.

**30. ක්‍රීඩා ප්‍රවීණයන් ඇගයීම**

*විශිෂ්ඨ දක්ෂතා දක්වා ඇති සාක් ක්‍රීඩා, ආසියානු ක්‍රීඩා, පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා, ලෝක ශූරතා සහ ඔලිම්පික් පදක්කම්ලාභී ප්‍රවීණ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඇගැයීම.*

සියළුම ප්‍රධාන ජාත්‍යන්තර ක්‍රීඩා තරඟ වලින් ජයග්‍රහණ ලබා ඇති ප්‍රවීණ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඇගැයීම සහ ඔවුන්ව ජාතික සම්මාන සමග නියමිත රෙගුලාසිවලට අනුව මූල්‍ය දිරිගැන්වීම් ලබා දීමට කටයුතු කෙරේ.

**31. ක්‍රීඩාවට ප්‍රවීණයන්ගේ අතහිත**

*ජාත්‍යන්තර ක්‍රීඩා තරඟ වලින් ජයග්‍රහණ ලබා ඇති ප්‍රවීණ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ විශේෂඥ දැනුම නවකයන් සමග බෙදා ගැනීම සඳහා ඔවුන් ක්‍රීඩා කේෂේත්‍රයේ රැකියාවක නියුතු කරවීම.*

ජාත්‍යන්තර ක්‍රීඩා තරඟ වලින් ජයග්‍රහණ ලබා ඇති ප්‍රවීණ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට තව දුරටත් ක්‍රීඩාවේ නියැලී සිටීමට අවශ්‍ය දිරිගැන්වීම් ලබාදෙන අතර ඔවුන් සතු විශේෂඥ දැනුම අළුතින් එන සහ නවකයන් සමග බෙදා හදාගත හැකි වන ආකාරයෙන් ඔවුන් ප්‍රයෝජනවත් රැකියාවක නියුතු කරවීමට අවශ්‍ය පියවර ගැනේ.

**32. ක්‍රීඩා ප්‍රවීණයන්හට රැකවරණය**

*ජාතික හා ජාත්‍යන්තර තරඟ ජයග්‍රහණ ලබා ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් සියළු ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා සමාජ සංරක්ෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.*

තමන් සතු බොහෝ දේ කැපකර, ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා තරඟවලදී ජයග්‍රහණ ලබා ශ්‍රී ලංකාවට කීර්තිය ගෙන දුන් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ආරක්ෂාව හා සුභ සිද්ධිය සලසා සුදුසු ජාතික සංරක්ෂණ වැඩසටහනක් ආරම්භ කරනු ලැබේ.

**33. ක්‍රීඩාව සඳහා ස්වාධීන විනිශ්චය සභාවක්**

*ක්‍රීඩාව පිළිබඳ ආරවුල් නිරාකරණය කිරීම සඳහා ස්වාධීන විනිශ්චය සභාවක් හා බේරුම්කාර මණ්ඩලයක් ස්ථාපිත කිරීම.*

ක්‍රීඩා ක්ෂේත්‍රයේ උද්ගත වන ආරවුල් සහ විනය කටයුතු විභාග කර විසඳීම සඳහා ස්වාධීන විනිශ්චය සභාවක් හා බේරුම්කාර මණ්ඩලයක් පත්කොට එහි කටයුතු ස්වාධීනව හා පාරදෘශ්‍ය භාවයකින් යුතුව සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

**34. ක්‍රීඩාවට බදු සහන**

*ජාතික ක්‍රීඩා සංගම් හා ක්‍රීඩාවට සම්බන්ධ රාජ්‍ය ආයතන විසින් ආනයනය කරනු ලබන ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ සියළු බදුවලින් නිදහස් කිරීම.*

ජාතික ක්‍රීඩා සංගම් සහ එම සංගම්වල හා ඒවායේ සාමාජිකයින්ගේ අවශ්‍යතා සඳහාත්, ක්‍රීඩාවට සම්බන්ධ රාජ්‍ය ආයතන විසින් ආනයනය කරනු ලබන ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ, ක්‍රීඩා වෛද්‍ය උපකරණ බෙහෙත් හා පෝෂණ ද්‍රව්‍යය ආනයනය කිරීමේදී සියළු බදුසහන සලසා දීමට කටයුතු කෙරේ.

**35. ක්‍රීඩාවට අතහිත දෙන්නන්ට බදු සහන**

*ක්‍රීඩා සංවර්ධනය සඳහා පෞද්ගලික ආයතන විසින් විවිධාකාරයෙන් දෙනු ලබන අනුග්‍රහකත්වයන් සඳහා බදු සහන ලබාදීම.*

ක්‍රීඩා සංවර්ධනය උදෙසා ක්‍රීඩාවට අදාල රාජ්‍ය ආයතනයන්ට සහ ක්‍රීඩා සංවිධානයන්ට පෞද්ගලික අංශය විසින් සලසා දෙනු ලබන අනුග්‍රහකත්වයන් සඳහා අදාල අමාත්‍යාංශය විසින් සහතික කරනු ලැබීමෙන් පසුව බදු සහන සලසා දීමට කටයුතු කෙරේ.

**36. ක්‍රීඩා සංගම් සඳහා වාණිජමය පදනමක්**

*වාණිජමය ලෙස වර්ධනය කළ හැකි ක්‍රීඩා සංගම් තෝරාගෙන එම ක්‍රීඩා සංගම් ආර්ථිකමය වශයෙන් ඵලදායී ලෙස පවත්වා ගැනීම.*

ක්‍රීඩා ආශ්‍රිත ආර්ථිකයක් ගොඩනැගිය හැකි වන පරිදි ක්‍රීඩා සංගම්වල කටයුතු සඳහා වාණිජමය වටිනාකමක් ඇතිවන ආකාරයට පවත්වාගෙන යාමට උනන්දු කෙරේ.

**37. සෑම රැකියා ස්ථානයකම ක්‍රීඩාවට අවස්ථාවක්**

*සියළුම රැකියා ස්ථාන/වැඩපොළකම ක්‍රීඩාවට අවකාශය හා සානුබලයන් ලබා දීම.*

ශ්‍රම බලකායේ ශාරීරික සුවතාවය, ඵලදායීතාවය හා තෘප්තිය වර්ධනය සඳහා ක්‍රීඩාව යොදාගත යුතු අතර ඒ සඳහා රැකියා ස්ථානයන් හී කාලය, අවශ්‍ය පහසුකම් හා සානුබලයන් ලබා දෙමින් ශ්‍රමිකයින් ක්‍රීඩාවට දිරිගැන්විය යුතුය.

**38. ක්‍රීඩාවට ජනමාධ්‍යයන්හි ප්‍රමුඛත්වයක්**

*ක්‍රීඩාව හා ක්‍රීඩක ක්‍රීඩිකාවන් දිරිගන්වන ප්‍රචාරනයක් ලබාදීම, ක්‍රීඩා අධ්‍යාපන ලිපි ලේඛන පලකිරීම හා මහජනතාව තුළ උද්යෝගයක් ඇති කෙරෙන ආකාරයට ප්‍රචාරයක් ලබාදීමෙන් ඔවුන් දිරිගැන්විය යුතුය.*

ජනතාව අතර ක්‍රීඩාව ප්‍රචලිත කිරීම හා ඔවුන් තුළ ක්‍රීඩාව පිළිබඳ ප්‍රබෝධයක් ඇති කෙරෙන ආකාරයේ මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යයන් මගින් ප්‍රමුඛ අවකාශයන් සලසා දී අපක්ෂපාතී, සමතුලිත හා ක්‍රීඩකයින් දිරිගන්වන ආකාරයේ ක්‍රීඩා ප්‍රවෘත්ති ලිපි ලේඛන හා ක්‍රීඩක ක්‍රීඩිකාවන් සම්බන්ධ තොරතුරු මෙන්ම ක්‍රීඩා නිලධාරින් පිළිබඳවද ප්‍රචාරයක් එමගින් ලබාදිය යුතුය.

ක්‍රීඩාව පොදු ජනයා අතරට ගෙනගොස් ඒ කෙරෙහි ඔවුන් තුළ උනන්දුවක් ඇතිකර ක්‍රීඩාවට ජනයා ආකර්ෂණය කෙරෙන ආකාරයේ පුළුල් හා ධනාත්මක ප්‍රචාරයක් ලබාදීම මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යයන්හි වගකීම විය යුතුය. ක්‍රීඩා මාධ්‍යවේදීන් පුහුණු කිරීමත් දැනට පවතින අනෝන්‍ය සම්බන්ධය තව තවත් දියුණුකර උපාය මාර්ගික ලෙස ඔවුන්ගේ සේවාව ලබා ගැනීමත් ඒ අයුරින්ම ඉටුකළ යුතු වැදගත් කාර්යයකි.

**39. ජාතික තොරතුරු මධ්‍යස්ථානයක් හා කෞතුකාගාරයක්**

*නවීනතම තාක්ෂණික පහසුකම් හා ප්‍රමාණවත් සම්පත් වලින් පරිපූර්ණ, දේශීය හා විදේශීය ක්‍රීඩා තොරතුරු එසැනින් ලබාගත හැකි ක්‍රීඩා තාක්ෂණික තොරතුරු හා ඒ පිළිබඳ අළුත්ම වර්ධනයන් රැගත් ක්‍රීඩා තාක්ෂණික තොරතුරු හා නවතම සොයාගැනීම්, පර්යේෂණ හා සංඛ්‍යා ලේඛන, ක්‍රීඩාව පාලනය කෙරෙන නීතිරීති හා රෙගුලාසි එම මධ්‍යස්ථානයේ ගබඩා කළ යුතුය.*

අවශ්‍ය සියළු තොරතුරු සංඛ්‍යා ලේඛන හා දත්තයන් ජාතික ක්‍රීඩා තොරතුරු මධ්‍යස්ථාන මගින් (NSIC) එක්රැස් කර ගබඩා කර ගන්නා අතරම අදාල තොරතුරු ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට, ක්‍රීඩා පුහුණුකරුවන්ට, නිලධාරින්ට හා පරිපාලකයන්ටද කාලීනව ලබාදීමේ යාන්ත්‍රණයක් එමගින් ආරම්භ කර එම තොරතුරු නවීනතම තොරතුරු වලින් ප්‍රයෝජනයට ගතහැකි ආකාරයෙන් සැලසුම් කළ යුතුය. ජාතික ක්‍රීඩා තොරතුරු මධ්‍යස්ථානයේ (NSIC) තවත් කාර්ය භාරයක් විය යුත්තේ ඓතිහාසික ක්‍රීඩා ලියකියවිලි සංරක්ෂණය කර ප්‍රදර්ශනයට තැබීම, දෘෂ්‍ය ප්‍රතිරූප ද්‍රව්‍ය හා උපකරණ වෙනත් සුදුසු ආදර්ශන කොටස් ආදිය පිළියෙල කොට අනාගතය සඳහා ප්‍රදර්ශනය කොට තැබීමයි.

**40. ක්‍රීඩාවට ආචාර ධර්ම පද්ධතියක්**

*ක්‍රීඩාවට සම්බන්ධ සියළු පාර්ශවයන් විසින් පිළිපැදිය යුතු ආචාර ධර්ම පද්ධතියක් සකසා එය ක්‍රියාවට නැංවීම.*

ක්‍රීඩාවේ ගෞරවනීය පැවැත්ම උදෙසා සියළු ක්‍රීඩාවන් සඳහා ඒවාට සම්බන්ධ සියළු පාර්ශවයන් විසින් අනුගමනය කළ යුතු / පිළිපැදිය යුතු ආචාර ධර්ම පද්ධතියක් සකසා ප්‍රකාශයට පත්කර එම ආචාර ධර්ම පිළිපැදීමට හුරු කිරීම.

**41. ශ්‍රී ලංකාව ක්‍රීඩාවට තෝතැන්නක්**

*ජාත්‍යන්තර ක්‍රීඩා තරඟ පැවැත්වීමට ඉතාමත් සුදුසු ස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රචලිත කොට ක්‍රීඩා ආර්ථිකයක් එමගින් බිහිකිරීමට කටයුතු කරනු ලැබේ.*

ශ්‍රී ලංකාව කේන්ද්‍රස්ථානයක් කරගනිමින් එහි ස්වභාවික සෞන්දර්ය හා සම්පත් සම්භාරය උපයෝගි කරගනිමින් ක්‍රීඩා සඳහා ඉතාමත් සුදුසු කේන්ද්‍රස්ථානයක් වශයෙන් ලොව පුරා ප්‍රචලිත කරමින් ආර්ථික සම්පත් ඉපයීමට හැකිවන අයුරින් ක්‍රීඩා ආර්ථිකයක් සංවර්ධනය කිරීම.

**42. සංචාරක ආකර්ශණය සඳහා ක්‍රීඩාව**

*සංචාරකයින් ආකර්ශණය කරගත හැකි ක්‍රීඩාවන් හඳුනාගෙන ආර්ථිකමය වශයෙන් සවිබල කිරීම.*

ශ්‍රී ලංකාව සංචාරක පාරාදීසයක් බවට පත්කිරීම අරමුණු කොට ගෙන ක්‍රියාත්මක කෙරෙන ප්‍රමුඛ අංශයක් ලෙස ක්‍රීඩා හා ත්‍රාසජනක අත්දැකීම් ප්‍රචලිත කරමින් විනෝදාත්මක අවකාශයන් ප්‍රවර්ධනය කිරීම, දිරිගැන්වීම හා අර්ථිකමය වශයෙන් සඵල බවට පත් කිරීම.

**43. ක්‍රීඩා ආශ්‍රිත කර්මාන්ත ආර්ථිකයේ ප්‍රමුඛ අංශයක් බවට පත් කිරීම**

*ක්‍රීඩා කේෂ්ත්‍රයට අදාල භාණ්ඩ හා සේවා නිෂ්පාදනය හා අපනයනය සඳහා සානුබලයන් ලබා දීම.*

දේශීය අමුද්‍රව්‍ය හා ශ්‍රමය උපයෝගී කර ගනිමින් විදේශ විනිමය උපයන අපනයන ප්‍රවර්ධන හා ආනයන ආදේශන ක්‍රීඩා ආශ්‍රිත භාණ්ඩ හා සේවා ආරම්භ කරනු ලබන කර්මාන්ත සඳහා සානුබලයන් ලබා දීම හා ඒ ආශ්‍රිත ක්‍රීඩා කේෂ්ත්‍රයේ රැකියා උත්පාදනය දියුණු කිරීම.

**44. ක්‍රීඩාවෙන් වෘත්තීමය අවස්ථා**

*ක්‍රීඩා කේෂත්‍රයේ ඇති විවිධ වෘත්තීමය අවකාශයන් හඳුනාගෙන එම කේෂ්ත්‍ර සඳහා ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුත් වෘත්තීය පුහුණුව ලබා දී දේශීය හා විදේශීය ක්‍රීඩා කේෂ්ත්‍රයේ රැකියා අවස්ථාවන් දිනා ගැනීමට පහසුකම් සැලසීම.*

විවිධ ක්‍රීඩා සඳහා අත්‍යවශ්‍ය ප්‍රවීන වෘත්තීය පුහුණු කරුවන්, ක්‍රීඩා වෛද්‍ය කේෂ්ත්‍රයේ ප්‍රවීනයන්, ක්‍රීඩා කළමණාකරුවන්, සංවිධායකවරු, භෞතචිකිත්සකයින් හා සම්භාහකයින් වැනි කේෂ්ත්‍රයන්හී වෘත්තීමය අවස්ථා හඳුනා ගැනීම. එම කේෂ්ත්‍රයන්හී වෘත්තීමය පුහුණුව ලබා දී දේශීය හා විදේශීය වශයෙන් රැකියා අවකාශයන් සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීම.

**45. විනෝදාත්මක ක්‍රීඩා තුළින් ආර්ථික ප්‍රතිලාභ**

*ආර්ථිකමය වශයෙන් ප්‍රතිලාභ අත්කරගත හැකි විනෝදාත්මක ක්‍රීඩා ප්‍රචලිත කිරීම.*

ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය වශයෙන් ඇති විවිධ සම්පත් සහ අවස්ථාවන් උපයෝගී කර ගනිමින් නිර්මාණශීලී ලෙස විවිධ විනෝදාත්මක ක්‍රීඩා හඳුන්වා දෙමින් දේශීය හා විදේශීය ක්‍රීඩකයින් ආකර්ශණය කරගනිමින් ආර්ථිකමය වටිනාකමක් ජනිත කළ හැකි විනෝදාත්මක ක්‍රීඩා දිරි ගැන්වීම හා ප්‍රචලිත කිරීම.

06-98

2–G 16040 ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.